වාරියපොළ ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.914,853 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශන වල රු.820,163 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ප්‍රජාශාලා 04 ක හා ඒවා පිහිටි ඉඩම් වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සභාව සතු වත්කම් සමීක්ෂණය කර නිවැරදිව ලේඛනගත කිරීම තුළින් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ප්‍රජා ශාලා සහ ඒවා පිහිටි ඉඩම් සභාවට අයත් දේපළ නොවන බැවින් තක්සේරු කිරීමක් හෝ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කිරීමක් කර නොමැති බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 වර්ෂයේ දෙසැම්බර් මසට අදාළව ලැබිය යුතු උසාවි දඩ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ආදායම් ගිණුම්ගත කළ යුතු වේ. | මෙය ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබී ඇති රු. 32,545,383 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු සඳහා අදාළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ සඳහා ගැලපීම් කිරීම ගිණුම් සකස් කිරීමේදී අතපසු වී ඇති බවත් මීළඟ වර්ෂයේ සිට එවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ වෙනත් ආදායම් රු. 109,275 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | මීළඟ වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව සඳහන් කරමි. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.51,800 ක හා රු.46,800 ක ලී බඩු හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020.12.31 දිනට අවසාන ගිණුම පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි ආදායම් ආධාර රු. 7,861,335 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු. 8,001,116 ක් ලෙස දක්වා තිබුණි. | වර්ෂයට අදාළ ආදායම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මීළඟ වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ඌ) | එකතුව රු. 52,264,400 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සඳහා අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පෙර පාසල් හා පුස්තකාලවල ඉන්වෙන්ට්‍රි ලේඛන එම ආයතනවල පවතින අතර කර්මාන්ත තැන්පත් ලේඛන හා ණයගැති ලේඛන නිවැරදි කර යාවත්කාලීන කර ඇත. |

## 1.4 අනුකූල නොවීම්.

-------------------

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්.

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි<br>1645 හා 1646 | ගමන් පිළිබඳ මූලික සාරාංශ හා දෛනික ධාවන සටහන් නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී වාහනවල මාසික සාරාංශයේ මුල් පිටපත සහ වාහනවල දෛනික ධාවන සටහන් ඔබ වෙත එවන බව දන්වමි. |

## 1.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එන ලද රු.58,218 ක ග්‍රාමීය ජල ව්‍යාපෘති ගිණුම විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඒ සම්බන්ධ කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකිවූ බැවිනුත් මෙය දිගින් දිගටම ඉදිරියට ගෙන යාම අනවශ්‍ය බැවින් ජර්නල් සටහනක් මගින් කපා හැරීමට කටයුතු කළෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,608,022 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 75,100,312 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 9,841,000 | 9,840,433 | 8,872,119 | 1,567,515 | 5,546,000 | 6,555,877 | 5,956,675 | 599,202 |
| II. | කුලී | 13,302,045 | 15,389,058 | 13,530,893 | 1,879,630 | 10,360,000 | 11,049,771 | 11,028,306 | 21,465 |
| III. | බලපත්‍ර ගාස්තු | 1,244,000 | 1,040,678 | 1,040,678 | - | 1,247,000 | 1,108,587 | 1,108,587 | - |
| IV. | වෙනත් ආදායම් | 189,536,000 | 169,964,174 | 197,202,412 | 10,576,231 | 182,630,000 | 228,174,734 | 190,360,264 | 37,814,470 |
| එකතුව | | 213,923,045 | 196,234,343 | 220,646,102 | 14,023,376 | 199,783,000 | 246,888,969 | 208,453,832 | 38,435,137 |

සටහන

2018 හා 2019 වර්ෂ වල රැස්කළ ආදායම් අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟහිටි ලැබීම් ද ඇතුලත්ව තිබුණි. 2019 වර්ෂයේ රැස්කළ ආදායමින් රු. මිලියන 38 ක් ඉකුත් වර්ෂයට අදාළ ලැබීම් විය.

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පොදු වෙළඳපොල කඩ හිමියන් 49 ක ගෙන් රු.1,217,400 ක කඩකුලී මුදලක්ද, සුළු පරිමාණ කඩ හිමියන් 31 කගෙන් රු.328,595 ක කඩකුලී මුදලක්ද, අයවිය යුතුව පැවතුණි. | කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ කුලී තක්සේරුව වැඩිවීමෙන් කඩ හිමියන්ගේ විරෝධතාවය මත ඔවුන් විසින් ගෙවීම් නොකිරීම හේතුවෙන් ඇති වූ හිඟ මුදලක් වන අතර විරෝධතාවය පිළිබඳ තීරණයක් ලබාගැනීමට පලාත් පාලන කොමසාරිස්තුමා වෙත දන්වා යවා ඇත. |

**2.2.3 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ගලි රථය, ජල බවුසරය, බැකෝ ලෝඩරය, මාර්ග තලනය, ඩෝසර් යන්ත්‍රය හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබා දීමෙන් අයවිය යුතු ආදායම් පිළිවෙලින් රු.92,150, රු.57,200, රු.180,200, රු.434,200, රු.212,500 ක් හා රු.146,475 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වසර තුළ හිඟ මුදල් අයකරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව සඳහන් කරමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂය පිළිවෙලින් රු.516,500 ක් හා රු.1,009,605 ක් විය. | වර්ෂයේ ආදායම් හා හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019.12.31 දිනට උසාවි දඩ රු.516,500 ක හිඟය සහ මුද්දර ගාස්තු හිඟ මුදල මේ වන විටත් අයවී නැති අතර මේවා ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් එවනු ලබන නිසා අපහට එම හිඟය අයකර ගැනීම සම්බන්ධයෙන් කළ හැකි කාර්යයක් නොමැති බවද වැඩි දුරටත් සඳහන් කරමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබවිහරණය හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**කර්තව්‍යයන් ඉටු නොකිරීම**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී අයවැයගත රු.12,000,000 ක් වූ කර්මාන්ත 26 ක් ඉටුකර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණයන් නොලැබීම හේතුවෙන් අයවැය ගතකර තිබුණු රු.12,000,000 ක් වූ කර්මාන්ත 26 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීමට නොහැකි විය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සභාවට දැනුම් දීමකින් තොරව පොදු වෙළඳපොල කඩ කාමර 24 ක සුළු පරිමාණ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 18 ක් හා බස් නැවතුම්පල උඩුමහලේ කඩ කාමර 04 ක් බදුකරුවන් විසින් තක්සේරු මුදලට වඩා ඉහළ මුදලකට වෙනත් පුද්ගලයන්ට කුළී පදනම මත ලබා දී තිබුණි. | ගිවිසුම් කඩ කරන්නන් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳව සියළුම කඩකාමර හිමියන් දැනුවත් කළ බව සඳහන් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ණයගැති ශේෂයෙන් වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු. 28,701,116 ක් වූ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂයෙන් වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.35,012,457 ක් වූ ශේෂ ගෙවා නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 7,016,296 ක් වූ තැන්පත් මුදලින් ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආපසු ගෙවිය හැකි තැන්පත් වලින් ආදායමට ගත හැකි තැන්පත් ආදායමට ගැනීම සඳහා මේ වන විට කටයුතු කර ඇති බවත් අනෙකුත් තැන්පත් ඉල්ලීම් කිරීම අනුව ආපසු ගෙවීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

---

**සේවක පුරප්පාඩු**

---

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 16 ක් පැවති අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් 25 ක් හා 25/2014 චක්‍රලේඛය යටතේ තනතුරු 04 ක් සඳහා බඳවාගත් නිලධාරීන් 26 ක් සමඟ අතිරික්ත 51 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර අතිරික්ත අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලයේදී සභාව මඟින් බඳවා ගත හැකි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවද, 25/2014 චක්‍රලේඛය යටතේ බඳවාගත් නිලධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවා ඇති බවද දන්වමි. |
| (ආ) | වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2019 පෙබරවාරි 13 දිනැති ලිපියේ 4 වන වගන්තිය ප්‍රකාරව සභාවේ වැඩ බලන ලේකම්වරයාගේ නිත්‍ය තනතුරට අදාළ වැටුප් කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ ආරම්භක වැටුප් පරිමාව ඉක්මවා ඇති බැවින් වැඩ බැලීමේ දීමනාවක් හිමි නොවූවද 2019 ජූනි මස සිට 2019 දෙසැම්බර් මස දක්වා රු.43,482 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි. | විධිමත් අනුමැතියක් මත හෝ පත්වීම් ලිපිය ප්‍රකාරව වැඩ බැලීමේ දීමනා ගෙවීමට කටයුතු කළ යුතු වේ. | ආයතන සංග්‍රහයට අනුව වැඩ බැලීමේ දීමනාවක් ලබා දෙන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් කර ඇති බැවින්, රාජකාරී ඉටුකිරීමේ දීමනාව ලබාගෙන ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොදු වෙළඳපොල පළමු මහළ හා බිම් මහළ කඩ කාමර සඳහා වූ 2019 ජුලි 19 දිනැති තක්සේරුවට ඇති වූ විරෝධතා මත 2011 වර්ෂයේ තක්සේරු මුදලම අය කිරීමෙන් 2019 දෙසැම්බර් 31 දිනට සභා අරමුදලට රු.263,850 ක ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ හිමියන්ගේ විරෝධතා හේතුවෙන් තක්සේරු වටිනාකමින් 50% ක් අය කරන ලෙස ඉල්ලීම් කළද එයට එකඟ නොවීම මත නැවත 25% කින් තක්සේරුව අඩුකර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |
| (ආ) | බදුකරු විසින් ඉදිකිරීම් සම්පූර්ණ කිරීම හේතුවෙන් වසර 04 ක් මාසික කුලී අය නොකළ වාරියපොල නව පොදු වෙළඳ සංකීර්ණයේ දෙවන මහලේ කඩ කාමර 04 ක් සඳහා වසර 04 ඉක්ම වුවද 2019 ජුලි 04 දිනැති තක්සේරුව අනුව ගාස්තු අය නොකිරීම මත සමාලෝචිත වර්ෂය සඳහා රු.200,000 ක ආදායම් අහිමි වී තිබුණි. | නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ හිමියන්ගේ විරෝධතා හේතුවෙන් තක්සේරු වටිනාකමින් 50% ක් අය කරන ලෙස ඉල්ලීම් කළද එයට එකඟ නොවීම මත නැවත 25% කින් තක්සේරුව අඩුකර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |
| (ඇ) | වාරියපොල සුළු පරිමාණ වෙළඳ සංකීර්ණයේ බිම් මහල කඩ කාමර 29 ක් හා අමතර කඩ කාමර 02 ක් සඳහා 2019 පෙබරවාරි 21 දිනැති තක්සේරුව අනුව ගාස්තු අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.605,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | නව තක්සේරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | කඩ හිමියන්ගේ විරෝධතා හේතුවෙන් කඩ කාමරවල තක්සේරු වටිනාකම 50% කින් අඩු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇතත් එහි වෙනසක් සිදු නොවන බව දන්වා ඇති අතර නැවත තක්සේරු වටිනාකමින් 25% ක් වත් අඩු කිරීමට අනුමැතිය ලබාදෙන ලෙස නැවත තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන සුසාන භූමි 92 ක් සමාලෝචිත වර්ෂය තුළදීද සභාව වෙත පවරාගෙන නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පවරා දීමට අවශ්‍යා කටයුතු සලසා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහිම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. |

**3.6 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාරියපොල ප්‍රාදේශීය සභාවේ හිටපු ලේකම්වරයාට දීර්ඝ කාලයක සිට මසකට රු. 2,000 බැගින් සතිපොළ දීමනා ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ස්ථාන මාරු වී යන තෙක් මැයි මස දක්වා සතිපොළ දීමනා වශයෙන් රු.10,000 ක් ගෙවීම් කර තිබුණි. | විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඒ සඳහා සතියකට රු. 500 බැගින් මසකට රු. 2,000 ක දීමනාවක් මහා සභා අනුමැතියකින් පෙර සිටම ගෙවා ඇත. |

**3.7 හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වීදි පහන් උපකරණ මිලදී ගැනීමේදී ආයතන විසින් එවන ලද අවම මිල ගණන් ප්‍රතික්ෂේප කිරීමට පිළිගත හැකි ගුණාත්මක හේතුන් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් නොකිරීම මත සභාවට රු.221,440 ක පාඩුවක් සිදුවී තිබුණි. | කිසියම් භාණ්ඩයක් තෝරා ගැනීමේදී තෝරා ගැනීමට හේතු වූ ගුණාත්මක කරුණු තාක්ෂණ කමිටු තීරණයේ ඇතුළත් කළ යුතු වේ. | ඉල්ලා ඇති පිරිවිතරයන්ට අනුකූල භාණ්ඩ මිළදී ගැනීම සිදු කෙරෙන බැවින් මිල අඩු බල්බ මිළදී ගෙන නොමැති බව පෙන්වමි. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | ටයර්, ටියුබ් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අවම මිල ගණන් පිළිනොගැනීමට ගුණාත්මක හේතු ඉදිරිපත් කර නොතිබීම මත සභාවට රු.81,157 ක පාඩුවක් සිදුවී තිබුණි. | කිසියම් භාණ්ඩයක් තෝරා ගැනීමේදී තෝරා ගැනීමට හේතු වූ ගුණාත්මක හේතු තාක්ෂණ කමිටු තීරණයේ ඇතුළත් කළ යුතු වේ. | අවම මිලට මිලදී නොගැනීම සඳහා ආයතනයේ පිහිටීම් දුරස්ථ භාවය, ටයර්වල ගුණාත්මකභාවය හා කල්පැවැත්ම යන කරුණු හේතු වී ඇත. |

**3.8 ප්‍රසම්පාදනය**

----------------

**3.8.1 සැපයීම් හා සේවා**

---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------------- | ---------------------------- | ---------------------------------- |
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 (ඇ) ප්‍රකාරව මුල් වටිනාකමින් සියයට 50 ක සීමාවක් දක්වා නැවත ඇණවුම් කළ හැකි වුවත්, ඊට අනුකූල නොවන පරිදි විදුලි උපකරණ මිලදීගත් අවස්ථා පැවතුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ගබඩා පහසුකම් සලසාගෙන එම ද්‍රව්‍ය එකවර මිළදී ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 (අ) වගන්තිය ප්‍රකාරව රු.950,400 ක් වූ මිලදී ගැනීම් සඳහා ලංසු ඉදිරිපත් කළ බවට සනාථ කිරීම් නොතිබුණු අතර මිල ගණන් විවෘත කළ දිනයේ සභාවේ දින මුද්‍රාව මිල සැදැහුම්වල යොදා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙහිදී යම් යම් හේතූන් මත සභාවේ දින මුද්‍රාව තැබීම ආදී කටයුතු අතපසු වී ඇති බව පෙනී යන අතර ඉදිරියේදී මෙවන් අඩුපාඩු ඇතිවීමකින් තොරව කටයුතු කිරීමට පියවර ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කරමි. |

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළද, මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරිනියට එම රාජකාරියට අමතරව වෙනත් රාජකාරී කටයුතුද පවරා ඇති බැවින් අභ්‍යන්තර රාජකාරී පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කිරීම සිදු කරන බවත්,සම්පූර්ණ වාර්තාවක් සකස් නොකරන නිසා විගණනය වෙත එහි පිටපතක් එවීමට කටයුතු නොකළ බවත් සඳහන් කරමි. |